# ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගමය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් 2015 මාර්තු මාසයේදී සම්මත කර ගන්නා ලද 'ආපදා අවදානම අඩු කිරීම සඳහා වන සෙන්දායි රාමුව (2015-2030) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2015 මැයි මාසයේදී අනුමත කරන ලදී. ආපදා අවදානම අඩු කිරීම සඳහා වන සෙන්දායි රාමුව මගින් ඉදිරි වසර 15 ක කාල පරිච්ඡේදය තුළදී අනුගමනය කරනු ලබන ගෝලීය ක්‍රියාමාර්ගය විස්තර කෙරෙයි. ආපදා අවදානම අඩු කිරීමේ මූලික කාර්ය භාරය රජයට පැවරෙන නමුත්, එම වගකීම පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශය සහ අනෙකුත් පාර්ශවයන් ද ඇතුළු පාර්ශවකරුවන් අතර බෙදා ගත යුතු බව සෙන්දායි රාමුව විසින් හඳුනා ගෙන ඇත. ආපදා අවදානම වඩාත් හොඳින් අවබෝධ කර ගන්නා ලෙසටත්, ආපදා අවදානම පාලනය කිරීම ශක්තිමත් කරන ලෙසටත්, ආපදා අවදානම අඩු කිරීම සඳහා ආයෝජන සිදු කරන ලෙසටත්, 'වඩාත් හොඳින් නැවත ගොඩනැගීම' පිණිස ආපදා වලට ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කරන ලෙසටත් මෙම රාමුව රජයයන්ගෙන් බල කර ඉල්ලා සිටියි. එය ක්‍රියාත්මක කිරීම පිණිස මනා දැනුවත් භාවයෙන් යුතුව තීරණ ගැනීම සඳහා සහ නව්‍ය වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා බහුවිධ විෂයයන්හි ප්‍රවීණත්වය යොදා ගන්නා ලෙසට එමගින් බල කර සිටියි. සෙන්දායි රාමුව සකස් කර අවසන් කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබා ගැනීම සඳහා සිදු කරන ලද අදහස් විමසීම් සහ සාකච්ඡා අතරතුරදී, එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දීම පිණිසත්, සියලු පාර්ශවකරුවන් ක්‍රියාමාර්ගවල නියැළීම සහ ක්‍රියාමාර්ගවල අයිතිය දැරීම සහතික කිරීම පිණිසත්, ආපදා අවදානම අඩු කිරීමේදී වගවීම ශක්තිමත් කිරීම පිණිසත් ප්‍රායෝගික වූ, සාක්ෂි පදනම් කර ගත් මගපෙන්වීමක් සකස් කරන ලෙසටත් දැඩි ඉල්ලීම් ඉදිරිපත් විය.

ස්වභාවික උපද්‍රව සඳහා මෙන්ම සෞඛ්‍ය, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, පරිසරය, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය වැනි ප්‍රායෝගික ක්ෂේත්‍ර සඳහා ද ඇතුළුව, ස්වභාවික සහ සමාජ විද්‍යාවන්හි සහාය සහිත වූ, විවිධ විෂයයන් පුරා පැතිරුණු සහ සීමා මායිම් ඉක්මවන ප්‍රවේශයක් අවශ්‍ය කරන, සෑම අංශයකටම ආපදා අවදානම අඩු කිරීම ගැටළුවක් වේ. ඒවායෙහි කළමනාකරණය සඳහා අඛණ්ඩවම අදාළ නිපුණතාවයන් දියුණු කළ යුතු වන බැවින් ඒ සඳහා වෘත්තීයමය ප්‍රවේශයක් අවශ්‍ය කරයි.

ආපදා කළමනාකරණය සහ ආපදා අවදානම් අඩු කර ගැනීම සඳහා ප්‍රගාමී ප්‍රවේශයක් ගම්‍යමාන කෙරෙන කරුණක් වන, ආපදා අවදානම අඩු කිරීම, අත්‍යාවශ්‍ය වූ වෘත්තීයමය විෂයයක් වශයෙන් හඳුනා ගැනීම ශ්‍රී ලංකාව තුළ තවමත් සාක්ෂාත් කර ගෙන නැත. එවැනි නිපුණත්වයන් මෙරට තිබෙන නමුත් එය විවිධ වෘත්තීයමය විෂය ක්ෂේත්‍ර තුළ විසිරී පවතින බැවින් වර්තමානයේ පවතින ආපදා අවදානම අඩුකිරීමේ විෂයයෙහිදී එය ප්‍රයෝජනයට නොගනියි. ඒකාබද්ධ වූ ප්‍රවේශයක් මගින් එම අභිමතාර්ථ දෙකම ඉටු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස පවතින ආයතනික දැනුම මෙන්ම දේශපාලන සහාය ද පෙළඹවීමට ලක් කරන බැවින් එවැනි ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් ලබා ගත හැකි සැබෑ ප්‍රතිලාභ තිබේ. විශේෂයෙන්ම ආපදා අවදානම අඩු කිරීම සඳහා සහ අනුවර්තනය වීම සඳහා ඇති උපායමාර්ග සහ මෙවලම් වලින් බොහොමයක් මෙහිදි එකිනෙක හා සමපාත වේ.

ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගමය ස්ථාපනය කිරීම මෙම අවශ්‍යතාවයට ආමන්ත්‍රණය කිරීමකි. ශ්‍රී ලංකා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ වෘත්තීයවේදීන්ගේ සංගමය යනු ශ්‍රී ලංකාව තුළ ආපදාවල බලපෑමෙන් සුරක්ෂිත වූ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා පිහිටුවා ගත් විවිධ වූ විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරන වෘත්තීයවේදීන්ගේ සංගමයකි. ශ්‍රී ලංකා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ වෘත්තීයවේදීන්ගේ සංගමය ආපදා අවදානම් අඩුකිරීමේ වෘත්තිකයින්ගේ, විද්‍යාඥයින්ගේ, සහ රජයේ, අන්තර්ජාතික/ජාතික සංවිධානවල සහ ශ්‍රී ලංකාවේ තිබෙන අනෙකුත් ආපදා අවදානම් අඩුකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනවල උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සංගමයකි. එමගින් සෙන්දායි රාමුව, පැරිස් ගිවිසුම (2015-2030), සහ අදාළ තිරසර සංවර්ධන ඉලක්ක එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වන සංවාද මණ්ඩපයක් නිර්මාණය කර දෙයි.

**'දේශගුණික අවදානම් ද ඇතුළු ආපදා අවදානම් අඩු කිරීමට අපට අවස්ථාවක් නොලැබුණ හොත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අපිට හැකි වනු ඇතැයි සිතිය නොහැක.'**

ආපදා අවදානම අඩුකිරීම සහ දේශගුණ විපර්යාසවලට අනුගත වීම, ආපදා අවදානම අඩුකිරීම සඳහා දැනට පවතින ප්‍රයත්නයන් සහ ඒ හා සමාන අනෙකුත් සැලසුම්කරණ ක්‍රියාවලීන් සමග ඒකාබද්ධ කිරීමල ප්‍රතිවර්තනය ගොඩනැගීම සඳහා දැනට ක්‍රියාත්මකව පවතින ප්‍රයත්නයන්ට ප්‍රතිලාභ අත් කර දෙනු ඇත. එහි අඛණ්ඩව ක්‍රියාත්මක වන සහ මැනවින් දෘශ්‍යමාන වන කාර්යයන් වන වෘත්තීයමය විශිෂ්ඨත්වය සංවර්ධනය කිරීම, මහජනයා දැනුවත් කිරීම, සහ අදාළ පර්යේෂණවල නියැළීම යන කාර්යයන් වෙතින් එහි බලපෑම ගලනය වනු ඇත. එහි කාර්යයන් හරහා වෘත්තීයවේදී ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතීන් නිර්වචනය කිරීමට සහ නියම කිරීමටත්, පිළිගැනීමේ ස්වරූප හරහා ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමටත් එය උපකාරී වනු ඇත. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගමයෙහි පදනම් මූලධර්ම මගින් ආපදා අවදානම් අඩුකිරීම වෘත්තීයමය නිපුණතාවලට සංකලනය කිරීම සඳහා මහඟු අවස්ථාවක් සපයා දෙයි.

ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගමයෙහි අරමුණු ද ඇතුළුව වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා www.adrimp.org.lk වෙබ් අඩවියට පිවිසෙන්න.